# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/152/2024 (NPC)

**එම්.එන්.කුමාරසිරි**

**අභියාචක**

**එදිරිව**

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

**වගඋත්තරකරු**

**දිනය :-2026.04.09**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් නීතිඥ ඩබ්.එච්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා,
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය සමඟ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

## -නියෝගය-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

එම්.එන්.කුමාරසිරි නමැති අභියාචක විසින්, 2024.01.19 වෙනි දිනැතිව, මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් පහත සඳහන් සහනයන් ඉල්ලා ඇත.

අ. 2022.12.23 වන දින පොලිස්පතිතුමාගෙන් ලද අංක D/HRM/PRO/302/2022 හා CRTM 398 දරණ පණිවුඩය අනුව 2020.02.08 වන දිනට වසර 08ක් සම්පූර්ණ සහ 2020.02.08 වන දිනට වසර 03ක නොකැළැල් සේවා කාලයක් සපුරන ලද උප පොලිස් පරීක්ෂකවරුන් හට පොලිස් පරීක්ෂක තනතුරු ලබාදීමේ දී වසර තුනක සේවා කාලය, පොලිස්පතිතුමා විසින් එතුමාගේ අංක PHQ/ED/09/02-04 සහ PHQ/ED/15/67/2015 දරණ ලිපිගොනු වලට අනුව මා නැවත සේවයේ පිහිටුවීමට අදාළව අවශ්‍ය වාර්තා කැඳවා අවසන් කළ 2017.01.24 වන දින සිට ගණන් බැලීම සුදුසු යැයි ප්‍රකාශ කරන ලෙසත්,

ආ. පොලිස්පතිතුමා විසින් එතුමාගේ අංක PHQ/ED/09/02-04 සහ PHQ/ED/15/67/2015 දරණ ලිපිගොනු වලට අනුව මා නැවත සේවයේ පිහිටු වීමට අදාළව අවශ්‍ය වාර්තා කැඳවා අවසන් කල දින එනම් 2017.01.24 වන දින මා නැවත සේවයේ පිහිට වූ බවට සළකමින් නියෝග කරන ලෙසත්.

ඉහත ඉල්ලා ඇති සහන පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ, පොලිස්පතිතුමාගේ තීරණයක් අනුව, වසර 08ක් සම්පූර්ණ කරන ලද සහ 2020.02.08 වෙනි දිනට වසර 03ක නොකැළැල් සේවා කාලයක් සම්පූර්ණ කරන ලද උප පොලිස් පරීක්ෂකවරුන් හට ලබා දී තිබූ පොලිස් පරීක්ෂක තනතුර, අභියාචක වෙතද ලබා දෙන ලෙස අයැද ඇති බවයි. ඉහත කී ආකාරයට ලබා දී ඇති පොලිස් පරීක්ෂක තනතුර අභියාචක හට නොලැබී ගොස් ඇත්තේ, 2020.02.08 වෙනි දිනට වසර 03ක පූර්ව කාල පරිච්ඡේදයක් තුළ නොකැළැල් සේවා කාලයක් ඔහු විසින් සම්පූර්ණ කර නොතිබීම නිසාවෙනි. උසස්වීම් පෙරදාතම් කරන ලෙසට ඉල්ලා සිටින, 2020.02.08 දිනට පෙර කාල පරිච්ඡේදය මත වු වසර 03 ක සේවා කාලය ඇතුළත නොකැළැල් සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, උසස්වීම ලබාගැනීම සඳහා අවශ්‍ය වන එක් සුදුසුකමකි.

අභියාචක වෙත නිකුත් කර තිබූ සේවය අත්හැරයාමේ නියෝගය ඉවත් කිරීම සම්බන්ධයෙන් අභියාචක විසින් ඉදිරිපත් කර තිබූ ඉල්ලීමක් සළකා බලා, 2016.08.25 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අභියාචක නැවත සේවයේ පිහිටුවීමට ජාතික පොලිස් කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ බව අභියාචක විසින් ඉදිරිපත් කර තිබූ 2025.07.01 දිනැති ලිඛිත දේශන සමඟ ඉදිරිපත් කරන ලද X.1 දරණ 2016.10.30 දිනැති ලිපියෙන් පැහැදිලි වේ. සේවය අත්හැර යාමේ නියෝගය ඉවත් කර ගැනීම සඳහා අභියාචක විසින් ඉදිරිපත් කරන ලද හේතුව වන්නේ, ඔහුගේ කොඳුඇට පෙළේ ආබාධයක් හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවු බවට වූ කරුණකි. ඒ බව ඔහුගේ දේශන වලද සඳහන් කර ඇත.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සළකා බලා, පොලිස්පති විසින් නිකුත් කර ඇති RTM 563 දරණ දැනුම් දීම මත, අභියාචක නැවත සේවයේ පිහිටුවා ඇත. ඒ බව අභියාචනා පෙත්සම සමඟ, අමුණුම් 03 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති ලේඛනයෙන් පැහැදිලි වේ. එකී දැනුම් දීම අනුව, අභියාචක සේවයට වාර්තා කර ඇත්තේ, 2017.02.20 වෙනි දින දීය. 2017.02.20 වෙනි දින සිට වසර 03ක සතුටුදායක සේවා කාලය ගණන්

ගැනීම ආරම්භ වන්නේ 2017.02.08 වෙනි දින දිය. නොකැළල් සේවා කාලය ගැනිය යුතු ආරම්භක දිනය එකී, 2017.02.08 යන දිනය හේතුවෙන් අභියාචකගේ නොකැළල් සේවා කාලය සම්පූර්ණ වීම සඳහා දින 12ක අඩුවක් තිබී ඇත.

එකී දින 12 සම්බන්ධයෙන් වන ප්‍රමාදය නොසළකා හැර, අවශ්‍ය වන වර්ෂ 03ක සේවා කාලය සම්පූර්ණ කර ඇති බවට සළකමින්, අභියාචකට හිමිවිය යුතු පොලිස් පරීක්ෂක තනතුරට අදාළ උසස්වීම ලබාදෙන ලෙසට ඔහු විසින් ඉල්ලා ඇත. එම ඉල්ලීම සළකා බැලීමේ දී පහත සඳහන් කරුණු වලට විනිශ්චය අධිකාරයේ අවධානය යොමු විය.

සේවය අත්හැරයාම සම්බන්ධයෙන් අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සළකා බැලීමෙන් පසු, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඔහුගේ ඉල්ලීමට අවසර දී ඇති තීරණය ලබා දී ඇත්තේ 2016.08.25 වෙනි දින දීය. ඒ බව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති දේශන සමග අමුණා ඇති X.1 දරණ 2016.10.31 දිනැති ලිපියේ පැහැදිලිව සඳහන් කර ඇත. එසේ නම් අභියාචක වෙත නැවත සේවයේ පිහිටුවමින් ලබා දෙන ලද විනය දඬුවමද නිකුත් කිරීමට තීරණය කර ඇත්තේ 2016.08.25 වෙනි දින බව පැහැදිලිව පෙනී යයි. එම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබිය යුතු තිබූ පියවර සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අභියාචක සේවයට වාර්තා කිරීමට දන්වා ඇත්තේ 2017.02.17 වන දිනදීය. ඒ අනුව ඔහු 2017.02.20 දින සේවයට වාර්තා කර ඇත.

මෙහිදී ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කාල පරිච්ඡේදය ගතවී ඇත්තේ, අභියාචකගේ පාලනයෙන් තොර හේතුන් නිසාවෙනි. එම තත්ත්වය වැටුප් ගෙවීම, යනාදි කටයුතු වලට බලපෑ හැකි නමුත්, අභියාචකගේ උසස්වීම සම්බන්ධයෙන් සළකා බැලීමේ දී පෙනී යන්නේ, එය ඔහුගේ පාලනයෙන් තොර කරුණක් වුවද, පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම, ඒ හේතුවෙන් ඔහුට අහිමි වී ගොස් ඇති බවයි. නැවත සේවයේ පිහිටුවන තෙක් අභියාචක කිසියම් සේවයක් පොලිස් දෙපාර්තමේන්තුවට ඉටුකර නොමැත. එබැවින් එම කාලය සඳහා වැටුප් හෝ අනිකුත් දීමනා නොගෙවීම සාධාරණ හා නීත්‍යානුකූල වන්නේය. කෙසේ වෙතත් ඒ මගින් අභියාචකගේ උසස්වීමටද එය බලපාන බවට තීරණය කළහොත්, එය සාධාරණ නොවේ. එබැවින් අභියාචක සම්බන්ධයෙන් හිමිවිය යුතු උසස්වීම සඳහා අවශ්‍ය වන, වර්ෂ 03ක නොකැළල් සේවා කාලය පදනම් විය යුත්තේ, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අභියාචක

නැවත සේවයේ පිහිටුවීමට ගෙන ඇති තීරණය ප්‍රකාශයට පත් කල දින සිට බව මෙම විනිශ්චය අධිකාරයේ මතය වන්නේය.

කරුණු එසේ වන විට, අභියාචක වෙත පොලිස් පරීක්ෂක තනතුර 2017.02.20 දිනට ලබා දීම සඳහා අවශ්‍ය වන පූර්ව වර්ෂ 03ක නොකැළැල් සේවා කාලය ඔහු විසින් සපුරා ඇති බවට තීරණය කරමු.

ඒ අනුව අභියාචකට 2020.02.08 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිස් පරීක්ෂක තනතුර හිමිවිය යුතු බවට වැඩිදුරටත් තීරණය කරමු.

ඉහත කී තීරණය ක්‍රියාත්මක කර, 2020.02.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි අභියාචක පොලිස් පරීක්ෂක තනතුරට පත් කිරීමට පියවර ගන්නා ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාවට නියෝග කරමු.

ඉහත කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර ලබාදීමට තීරණය කරමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-